ශීර්ෂය 220 ආයුර්වේද දෙපාර්තමේන්තුව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 220 - ආයුර්වේද දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආයුර්වේද දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 22 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයුර්වේද දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ පිටු අංක 05හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල පිටු අංක 05 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංසෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව ආයුර්වේද දෙපාර්තමේන්තුවේ මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ආයුර්වේද දෙපාර්තමේන්තුවේ මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලූම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ගණන්දීමේ නිලධාරීගේ (අදාළ වන පරිදි) වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ආයුර්වේද දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	දෙපාර්තමේන්තුව නිත්‍යානුකූල අයිතිය පවරා ගෙන තිබුණු ඉඩම් 04 ක වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. තවද, සිගාස් පරිගණක මුද්‍රිත සටහන් ප්‍රකාරව ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ශික්ෂණ රෝහලේ ඉඩමේ වටිනාකම වූ රු. මිලියන 53ක් දෙවරක් සටහන් කර තිබීම හේතුවෙන් ඉඩම්වල වටිනාකම එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	විගණන නිරීක්ෂණ පිළිගන්නා බව, විගණනයෙන් පෙන්වා දිමෙන් අනතුරුව 2025.04.17 දින අංක XE/2025/04/01 ජර්නලය මගින් මෙය නිවැරදි කිරීමට කටයුතු කළ බව.	සියළුම ඉඩම් ගිණුම්ගත කළ යුතු අතර මෙම අඩුපාඩු නිවැරදි කර 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය.
(ii)	දෙපාර්තමේන්තුව සතු පිරිවැය රු. මිලියන 20.98ක්වූ උපකරණ 09ක් 2024 වර්ෂයේදී ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව වෙත භාර දී තිබුණද එම වත්කම්වල පිරිවැයෙන් රු. මිලියන 16.99ක් පමණක් මූල්‍ය නොවන වත්කම් වලින් ඉවත් කිරීමට කටයුතු කර තිබුණි.	CIGAS පද්ධතියේ ගිණුම් ගත කර තිබුණු රු.16,997,333 ක එම වත්කම් අපහරණය කර ඇති බව.	මූල්‍ය ප්‍රකාශනවල අදාළ ගැලපීම් සිදු කළ යුතුය.

(iii)	දෙපාර්තමේන්තුවට අයිතිය නොමැති ඉඩම් 09 ක දෙපාර්තමේන්තුව විසින් ඉදිකර උපයෝජනය කරණු ලබන ගොඩනැගිලි 31ක වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී ගිණුම්කරණ සටහන් මගින් හෙළිදරව් කිරීමට සටහන් කරගත් බව.	මෙම තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය.
(iv)	ධාවන තත්ත්වයේ නොමැති කැබ් රථ 02 ක්, බස් රථයක් හා යතුරු පැදි 04ක් අපහරණ කටයුතු සඳහා 2022 පෙබරවාරි 14 දින සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත භාරදී තිබුණද, එම වත්කම්වල පිරිවැය හඳුනාගෙන මූල්‍ය නොවන වත්කම් වලින් ඉවත් කිරීමට පියවර ගෙන නොතිබුණි.	විගණනයෙන් පෙන්වා දී ඇති කරුණු සමඟ එකග වන බව. සිගාස් පද්ධතියට ඇතුළත් කර ඇති වාහන සම්බන්ධ තොරතුරු නිවැරදි කිරීමෙන් පසුව හා වාහන අපහරණය කිරීමේ කටයුතුවලින් අනතුරුව සිගාස් පද්ධතියෙන් මෙම පිරිවැය ඉවත් කර වාර්තා කිරීමට සටහන් කරගත් බව.	එම වත්කම්වල පිරිවැය හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය.
(v)	කල්බදු වාරික ගෙවීම් ක්‍රමය යටතේ 2012 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු පිරිවැය රු. මිලියන 8.40 ක් වූ වෑන් රථයක කල්බදු කාලසීමාවෙන් අනතුරුව දෙපාර්තමේන්තුව වෙත 2023 වර්ෂයේ පවරාගෙන තිබුණද, එම වාහනයේ පිරිවැය මූල්‍ය නොවන වත්කම් ලෙස සමාලෝචිත වර්ෂයේද ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.	විගණනයෙන් පෙන්වා දී ඇති කරුණු සමඟ එකග වන බව. සිගාස් පද්ධතියට ඇතුළත් කර ඇති වාහන සම්බන්ධ තොරතුරු නිවැරදි කර ඒ බව වාර්තා කිරීමට සටහන් කරගත් බව.	මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.

(ආ) අත්තිකාරම් ගිණුම් ශේෂ

විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
අවශ්‍යතාවය නිසි පරිදි හඳුනාගැනීමෙන් තොරව නිලධාරින් 15 දෙනෙකු විසින් අවස්ථා 30කදී ලබාගත්	පෙන්වා දී ඇති කරුණ පිළි ගන්නා බව, අත්තිකාරම් ලබා ගැනීමේදී ඇස්තමේන්තු පිරිවැයක් පදනම් කර ගත්තද	රාජ්‍ය මුදල් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.

අත්තිකාරම් මුදලේ වටිනාකම රු. මිලියන 1.65ක්වූ අතර ඉන් රු.752,708ක අත්තිකාරම් වැය නොකර පියවා තිබුණි. මෙම ඉතිරිය ලබාගත් අත්තිකාරම් මුදලින් සියයට 32ත් සියයට 87ත් අතර පරාසයක විහිදි තිබුණි.	සත්‍ය වියදම අඩුවීම හේතුවෙන් ඉතිරි මුදල් නැවත පියවීම සිදු කර ඇති බව.

(ඇ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i) හානි හා පාඩු ලේඛනය		
මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව යාවත්කාලීනකර නොතිබුණි.	ඉදිරියේදී යාවත්කාලීන කර පවත්වාගෙන යාමට කටයුතු කරන බව.	මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතු වීම.
(ii) බැරකම් පිළිබඳ ලේඛනය		
මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව පවත්වාගෙන ගොස් නොතිබුණි.	ඉදිරියේදී ආරම්භ කර පවත්වාගෙන යාමට කටයුතු කරන බව දන්වමි.	මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරික්ෂා කළ හැකි වන පරදි බැරකම් ලේඛනයක එම බැරකම් සටහන් කළ යුතු වීම.
(iii) චෙක්පත් භාරදීමේ ලේඛනය		
මුදල් රෙගුලාසි 260, 388 ප්‍රකාරව යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.	චෙක්පත් භාර දිමේ ලේඛනය යාවත්කාලින කර පවත්වා ගෙන යනු ලබන බව.	මුදල් රෙගුලාසි 260, 388 ප්‍රකාරව චෙක්පත් භාරදීමේ ලේඛනයක සටහන් කර චෙක්පත් බාරදීමට කටයුතු කළ යුතු වීම.
(iv) ඇප තැන්පත් ලේඛනය		
මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.	යාවත්කාලීන කර පවත්වාගෙන යාමට කටයුතු කරන බව.	මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතු වීම.

(v) වාහන ලොග් පොත

මුදල් රෙගුලාසි 1645(අ) ප්‍රකාරව යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.	යාවත්කාලීන කර පවත්වාගෙන යාමට කටයුතු කරන බව.	මුදල් රෙගුලාසි 1645(අ) හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව පොදු 267 අකෘතිය ප්‍රකාරව වාහන ලොග් පොත් සෑම වාහනයක් සම්බන්ධයෙන්ම පවත්වා ගත යුතු වීම.

(ඇ) විගණන සාක්ෂි නොවීම

පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු. මිලියන 5,036.59ක්වූ දේපළ, පිරියත හා උපකරණ වලට අදාළ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අදාළව අවසන් කර ඇති භාණ්ඩ සමීක්ෂණ වාර්තා මේ වන විට විගණනයට ඉදිරිපත් කර ඇති බව.	සියළුම භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා විගණනය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.
(ii)	දෙපාර්තමේන්තුව සතුව රු. මිලියන 93.94 ක් වටිනා වාහන පවතින බව මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර තිබුණද සිගාස් පරිගණක පද්ධතියේ එක් එක් වාහනය පිළිබඳ විස්තරාත්මක තොරතුරු සඳහන් කර නොතිබුණු බැවින් දෙපාර්තමේන්තුව සතු සියලු වාහනවල පිරිවැය මූල්‍ය ප්‍රකාශනවල නිරූපනය වන බවට තහවුරු කර ගැනීමට නොහැකි විය.	විගණන නිරීක්ෂණ පිළිගන්නා බව, සිගාස් දත්ත ගොනුවෙහි සිදු කළයුතු සංකීර්ණ සංශෝධනයන් හේතුවෙන් මෙය තවදුරටත් ප්‍රමාද වී ඇති බව, ආයතනයේ වාහන සම්බන්ධයෙන් වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 02/2024 චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන හා උපදෙස් අනුව මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ පද්ධතියට ඇතුළත් කර ඇති දත්ත අනුව CIGAS දත්ත ගොනුව සංශෝධනය කර ඒ බව විගණන අංශයට වාර්තා කිරීමට සටහන් කරගත් බව.	සිගාස් පරිගණක පද්ධතියේ එක් එක් වාහනය පිළිබඳ විස්තරාත්මක තොරතුරු සඳහන් කර ප්‍රමාණවත් වාර්තා පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
1.6.1 (ඈ)(vii)	අපහරණ කටයුතු කඩිනමින් අවසන් කළ යුතු අතර එම වත්කම්වල පිරිවැය හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශවලින් ඉවත් කිරීමට හා මූල්‍ය ප්‍රකාශනවල සටහන් මගින් තොරතුරු අනාවරණය කිරීමට කටයුතු කළ යුතුය.	1.6.1(අ) (iv)
1.6.1 (ඈ) (viii)	මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.	1.6.1(අ) (v)

3. මූල්‍ය සමාලෝචනය

3.1 අග්‍රිම කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ අග්‍රිම සැලැස්ම අනුව භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කරන ලද අග්‍රිම ප්‍රමාණය රු.2,701,111,550ක් වු අතර භාණ්ඩාගාරයෙන් නිදහස් කළ ප්‍රමාණය රු.2,214,744,456ක් වුයෙන් අග්‍රිම කළමනාකරණය සැලසුම්කළ පරිදි ඉටු කර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.	භාණ්ඩාගාරය විසින් අක්මුදල් නිදහස් කරනුයේ ගෙවීමට ඇති වව්චර්පත් ITMIS පරිගණක පද්ධතිය ඇතුළත් කිරීමෙන් පසු පමණක් බව, ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත නිදහස් කර ඇති අක්මුදල් වලින් එම ගෙවීම් නිදහස් කිරීම සිදුකර ඇති බව.	අග්‍රිම සැලැස්මට අනුව කටයුතු කළ යුතුය.

3.2 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අංක 220-1-1-0-1201 දරන වැය විෂයය සඳහා වෙන්කරන ලද රු. මිලියන 4.50ක මූලික ප්‍රතිපාදනයට අමතරව රු. මිලියන 3.00ක අමතර ප්‍රතිපාදන සපයා ගෙන තිබුණු අතර එම අමතර ප්‍රතිපාදනයෙන් රු.මිලියන 2.21ක් එනම් සියයට 73.76 ක ප්‍රතිපාදන ඉතිරිව තිබුණි.	මෙම ප්‍රතිපාදනය භාවිතයෙන් මිලදී ගැනීමට නියමිතව තිබූ ලිපි ද්‍රව්‍ය සඳහා ඇණවුම නිකුත් කළද අදාළ භාණ්ඩ දෙසැම්බර් 31 වැනි දිනට සපයා නොතිබුණු බැවින් මෙම ඉතිරිවීම සිදුවී ඇත. ඒ සඳහා ඇතිකරගත් බැදීම 2025 වර්ෂයේදී නිරවුල් කර ඇති බව.	දෙපාර්තමේන්තුවේ කාර්යභාරය, පෙර වර්ෂවල වියදම් ප්‍රවනතාවයන්, වෙළඳපල හා වෙනත් පාරිසරික සාධක සැලකිල්ලට ගෙන හැකිතාක් දුරට නිවැරදි හා තාත්වික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය.
(ආ)	අංක 220-1-1-0-1302 දරන වැය විෂයය සඳහා වෙන්කරන ලද රු. මිලියන 1.50ක මූලික ප්‍රතිපාදනට අමතරව රු.මිලියන 1.40ක ප්‍රතිපාදන මාරුකර ගෙන තිබුණු අතර එම අමතර ප්‍රතිපාදනයෙන් රු.917,684ක් එනම් සියයට 65.54 ක ප්‍රතිපාදන ඉතිරිව තිබුණි.	විගණන නිරීක්ෂණ හා එකඟ වන බව, තාක්ෂණික නිලධාරියෙකුගේ සහය ලබා ගැනීමට නොහැකි වීම මත අපේක්ෂිත වායුසමීකරණ නඩත්තු කටයුතු 2024.12.31 දිනට අවසන් කර ගැනීමට නොහැකි වීම නිසා මෙම ඉතිරිය ඇති වූ බව.	-එම-
(ඇ)	අංක 220-2-2-13-2509 (සුවතා සංචාරක කටයුතු ප්‍රවර්ධනය) සහ අංක 220-2-5-0-2002 දරන වැය විෂයයන් දෙක සඳහා අනුමත කරන ලද පිළිවෙලින් රු. මිලියන 100.00ක හා රු.100,000ක මුළු ප්‍රතිපාදන මුදලම ඉතිරිවී තිබුණි.	රු. මිලියන 100.00 සඳහා අනුමත කළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට යාමේදී වත්කම් වාර්තා කිරීම හා කළමනාකරණය සම්බන්ධයෙන් ඇති වූ ගැටළු හේතුවෙන් ව්‍යාපෘතිය ඉදිරියට කරගෙන යාම අදාළ ආයතන දැනුවත් කිරීමෙන් පසු අත්හිටුවීම නිසා උපයෝජනය නොවූ අතර රු. 100,000 මගින් පුරෝකථනය කරන ලද අළුත්වැඩියා වියදම් සඳහා ඉල්ලීම් නොලැබීම මත ඉතිරි වීම් සිදුව ඇති බව.	-එම-

(ඇ)	පුනරාවර්තන වැය විෂයයන් 18 ක් හා මූලධන වැය විෂයයන් 06 ක් වෙනුවෙන් අනුමත පිළිවෙලින් රු. මිලියන 28.62 ක හා රු. මිලියන 472.50 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් රු.මිලියන 14.53 ක හා රු. මිලියන 366.60 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. මෙම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 26.41 සිට සියයට 91.45 දක්වා පරාසයක පැවතුණි.	සැලසුම් කළ කාර්යන් සත්‍යය වශයෙන් ඉටු කර ගැනීමේදී අපේක්ෂිත පිරිවැය අවම වීම හෝ එම කාර්යයන් තෙවන පාර්ශවයන් වෙතින් ඉටු කර ගැනීමට සැලසුම් කළද අදාළ ආයතනයන්හි අභ්‍යන්තර ගැටළු මත මෙම ඉතිරිවීම් සිදුව ඇති බව.	-එම-

3.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2025 වර්ෂයේදී ගෙවන ලද නමුත් 2024 දෙසැම්බර් මසට අදාළ ගෙවීම් වවුචර 05ක වටිනාකම වූ රු.807,844ක් බැරකම් ලෙස හඳුනාගෙන නොතිබුණි.	2024-12-31 දිනට බැරකම් හඳුනාගෙන අවසන් ගිණුමේ ඇමුණුම් III හි ඇතුළත් කර ඇති බව.	සියළු බැරකම් නිවැරදිව හඳුනා ගෙන බැරකම් හා බැදීම් පිළිබඳ ප්‍රකාශයේ දැක්විය යුතුය.

3.4 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර	අභ්‍යන්තර විගණන අංශයේ හා අනෙකුත් අංශවල පවතින දැඩි මානව සම්පත් හිඟය නිසා මෙම තත්ත්වයේ උදාවී ඇති බව.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය.

එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

3.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

	නිරීක්ෂණය			ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
	නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	වටිනාකම රු.	අනුකූල නොවීම		
(i)	1947 අංක 16 දරන මහ නගර සහා ආඥා පනතේ 127 වගන්තිය	-	බොරැල්ල ආයුර්වේද ජාතික රෝහල ශික්ෂණ රෝහලක් බවට සංවර්ධනය කිරීමේ 02 වන අදියර යටතේ ඉදිකරන ලද මහල් 08 කින් යුතු නව ගොඩනැගිල්ලේ බිම් මහල ඇතුළුව මහල් 04 ක ඇඳන් 183කින් යුත් සමාන්‍ය වාට්ටු 05ක රෝගී සත්කාර සේවා ක්‍රියාත්මක කර තිබුණු නමුත් පනතේ විධිවිධාන ප්‍රකාරව අනුකූලතා සහතිකයක් ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	මෙම ගොඩනැගිල්ල ඉදිකිරීමට පෙර ලබාගත යුතුව තිබූ අනුතූලතා සහතිකය ලබා ගැනීමකින් තොරව මෙම ගොඩනැගිල්ල ඉදිකර ඇති බව, මේ වන විට අදාළ අනුකූලතා සහතිකය ලබා ගැනීමට අදාළව සම්පූර්ණ කළ යුතු වැඩ කොටස් අවසන් කිරීමට අදාළ කටයුතු සිදු කෙරෙමින් පවතින බව, මෙම වසර අවසාන වීමට පෙර අදාළ අනුකූලතා සහතිකය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට සටහන් කරගෙන ඇති බව.	1947 අංක 16 දරන මහ නගර සහා ආඥා පනතේ 127 වගන්තිය ප්‍රකාරව අනුකූලතා සහතිකයක් ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

(ii)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 758(1)	-	වාර්ෂික සමීක්ෂණයට අමතරව යටත් පිරිසෙකින් තෙමසකට වරක්වත් බඩු ලේඛන වවුචර සමඟ සසඳා බඩු ලේඛන පොත පරීක්ෂණ සෝදිසි වලට භාජනය කිරීමටද, තොග ශේෂයයන් සමඟ සසඳා ඇත්ත වශයෙන්ම තොගයෙහි ඇති භාණ්ඩ කිහිපයක් හරි වැරදි බැලීමද කලයුතු වුවත් ආයුර්වේද රෝහල්වල එකී විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	භාණ්ඩ සමීක්ෂණ සිදු කිරීම හා එහි අත්‍යවශ්‍ය බව සම්බන්ධයෙන් සියළුම රෝහල් අධ්‍යක්ෂවරුන් හා විෂය ලිපිකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහනක් මේ වන විට සිදුකර ඇති බව, ඉදිරියේදී මෙම තත්ත්වය නිවැරදි කරන බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(iii)	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 756(6)	-	ආයුර්වේද රෝහල්වල තොග ගබඩා හා උපගබඩා සම්බන්ධයෙන් තොග ලේඛන ගත භාණ්ඩ පිළිබඳ වාර්ෂික සමීක්ෂණ ඉකුත් වර්ෂ ගණනාවක සිට සමාලෝචිත වර්ෂය දක්වාම සිදුකර නොතිබුණි.	2024 වර්ෂයේදී අම්පාර, නින්දවූර් හා මංචංතෝඩුවාව යන රෝහල්වල ගබඩා පරීක්ෂණ කටයුතු අවසන් කළ අතර එම වාර්තාව විගණනය වෙත ලබා දී ඇති බව, අනෙකුත් රෝහල්වලද අදාළ සමීක්ෂණ කටයුතු සිදු කරන ලෙස රෝහල් වෙත දන්වා ඇති බව, අදාළ පරිදි කටයුතු කර ඔබ වෙත වාර්තා කරන බව.	-එම-

(iv)	2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය සහ 2017 අප්‍රේල් 19 දිනැති අංක 03/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපිය	- සියළුම රජයේ ආයතනවල ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර භාවිතා කිරීම මගින් නිලධාරින් කාර්යාලයට පැමිණීම හා පිටවීම සනාථ කිරීම සම්බන්ධයෙන් වාර්තා තබාගත යුතු බවට උපදෙස් හා විධිවිධාන නිකුත් කර ඇතත් ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතයකින් තොරව පැමිණීමේ ලේඛන පමණක් පදනම් කර ගනිමින් සමාලෝචිත වර්ෂයේදී ආයුර්වේද රෝහල් 11 ක නිලධාරීන් 1,614 දෙනෙකුට වැටුප්, අතිකාල හා නිවාඩු දින වැටුප් හා වෙනත් දීමනා ලෙස රු.94,450,328 ක් ගෙවා තිබුණි	ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය, දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය, කයිතඩි ආයුර්වේද ශික්ෂණ රෝහල, මන්වන්තොඩුවාව ආයුර්වේද පර්යේෂණ රෝහල යන ස්ථානවල සේවයේ නියුතු වෛද්‍ය නිලධාරින් හැර සෙසු කාර්යය මණ්ඩලය සඳහා අතිකාල හා නිවාඩු දින වැටුප් මේ වන විට ගෙවනුයේ ඇඟිලි සලකුණු යන්ත්‍රයෙන් ලබා ගන්නා වාර්තා පදනම් කරගෙන බව හා සෙසු ආයතනවල අංක.අමප/24/0944/410/043 හා 2024.06.19 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, අතිකාල සහ අමතර රාජකාරි දීමනා ගෙවීමේදී ආයතන ප්‍රධානියා විසින් පෞද්ගලිකව පැමිණීම පිටවීම විධිමත් පරිදි තහවුරු කර ගැනීමෙන් අනතුරුව පමණක් එම ගෙවීම සිදුකරනු ලබන බවට වග වීමට 2024.08.16 දිනැති ලිපියෙන් ආයතන ප්‍රධානීන් දැනුවත් කර ඇති බව, එ් පරිදි තහවුරු කරගන්නා ලද අතිකාල හා	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.

නිවාඩු දින සේවා වෙනුවෙන් පමණක් අතිකාල හා නිවාඩු දින වැටුප් හා වෙනත් දීමනා ගෙවා ඇති බව.

3.6 අවිධිමත් ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක BD/HRD111/14/2022 දරන 2023 දෙසැම්බර් 07 දිනැති කොම්ප්ට්‍රෝලර් ජනරාල් අමතන ලද ලිපියේ 03 වන ඡේදයට අනුව රජයේ අමාත්‍යාංශ දෙපාර්තමේන්තු, පළාත් සභා හා ව්‍යවස්ථාපිත ආයතන අතර වත්කම් මාරු කිරීම හා පැවරීමේ දී අදාළ වත්කම්හි පොත්වල වටිනාකම හා තක්සේරු වටිනාකම අතර වෙනසක් ඇතොත් එය වත්කම මාරු කිරීම හා පැවරීම සිදු කරනු ලබන ආයතනය විසින් ගෙවිය යුතු බවට අවධාරණය කර තිබුණද, එයට පටහැනිව තක්සේරු කිරීමෙන් හා මුදල් අයකර ගැනීමකින් තොරව පිරිවැය රු.20,980,575ක්වූ උපකරණ 09ක් ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව වෙත භාර දී තිබුණි.	රා.මු.චක්‍රලේඛ අංක 01/2020 II කොටස 8.1.3 ඡේදය ප්‍රකාරව කමිටුවක් පත් කිරීමට 2025.05.08 දිනැති ලිපියෙන් අමාත්‍යාංශ ලේකම් වෙත දන්වා යවා ඇති බව, අදාළ පරිදි කටයුතු කිරීමෙන් අනතුරුව ඔබ වෙත වාර්තා කිරීමට සටහන් කර ගත් බව.	ජාතික අයවැය දෙපාර්තමේන්තු උපදෙස් අනුව කටයුතු කළ යුතුය.

(ආ)	2024 අප්‍රේල් 08 දිනැති හා අංක 2379/02 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 7(උ), 10 සහ 77 වගන්ති සහ vi වැනි කොටස සමඟ කියවිය යුතු එකී පනතේ 82 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් සාධන ලද නියෝග ප්‍රකාරව අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් ලෙස ආයුර්වේද ඖෂධ හා නිෂ්පාදන නියාමන සභාවක් පිහිටුවනු ලැබිය යුතු වුවද, එලෙස නියාමන සභාව ස්ථාපිත කර නොතිබුණි. එසේ වුවද, අධිකාරි බලයෙන් තොරව උක්ත නියෝගවල 4(ඉ) ප්‍රකාරව ස්ථාපිත කළ යුතු කමිටු 04න් “ආයුර්වේද ඖෂධ පිළිබඳ තාක්ෂණික කමිටුව” ආයුර්වේද දෙපාර්තමේන්තුව තුළ ස්ථාපිත කර තිබුණි. එසේම ආනයන/ අපනයන කාර්යයන් සඳහා එක්සත් ජනපද ඩොලර් වලින් ගාස්තු අය කළ යුතු වුවත්, ඊට පටහැනිව ශ්‍රී ලංකා රුපියල් වලින් ගාස්තු අයකර තිබුණි.	2024 අප්‍රේ 08 දිනැති හා අංක 2379/02 දරණ අති විශේෂ ගැසට් පත්‍රය අනුව 2024.04.24 දින පළමු වන ආයුර්වේද ඖෂධ හා නිෂ්පාදන නියාමන සභාව පිහිටුවන ලද අතර එයට සමගාමීව සෙසු කමිටු 04 ද පිහිටුවා අදාළ ආයතන බල ගන්වන ලද බව, නව රජය බලයට පත් වූ පසු 2025.02.28 වන දින සිට දෙවන ආයුර්වේද ඖෂධ හා නිෂ්පාදන නියාමන සභාව හා ඒ යටතේ වන කමිටු පිහිටුවා අඛණ්ඩව ක්‍රියාත්මක වන බව, අදාළ අති විශේෂ ගැසට් නිවේදනයේ නියෝග අංක 114(02)(අ) අනුව අදාළ තැන්පතු ගාස්තු දේශීය මුදලින් ලබා ගෙන ඇති බව.	නියෝග ප්‍රකාරව කටයුතු කළ යුතුය.

3.7 වංචනික ස්වරූපයේ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
“AyurEx Colombo 2023” නමින් දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයක් හා අධ්‍යාපන වෙළඳ ප්‍රදර්ශනය සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ		

	148,149(1) ව්‍යවස්ථාවන්ට හා මුදල් රෙගුලාසි 132,170(2) ප්‍රකාරව කටයුතු නොකර ආයුර්වේද කොමසාරිස්වරයාගේ නිලනාමය භාවිතා කරමින් භාහිර පාර්ශව වෙතින් පරිත්‍යාග ලබා ගැනීමට ලිපි යවමින් සුභ සාධක සංගමයේ බැංකු ගිණුමට මුදල් බැර කිරීමට උපදෙස් දී තිබුණි. මෙහිදී, පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.		
(අ)	රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතනවලින් රු.28,469,950ක මුදලක් එකතු කරගෙන එම මුදල් දෙපාර්තමේන්තු සුභ සාධක සංගමයේ ගිණුමකට බැර කර ගෙන එම මුදලින් රු.28,326,935ක් වියදම් දරා තිබුණි.	“AyurEx Colombo 2023” සම්බන්ධයෙන් 2024.07.23 පැවැති රාජ්‍ය ගිණුම් කාරක සභා රැස්වීමේ දී සාකච්ඡා කළ අතර මේ සම්බන්ධයෙන් ලබා දුන් නියෝග අනුව කටයුතු මේ වන විට සිදුකර ඇති බව.	ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අදාළ ව්‍යවස්ථාවන්ට හා මුදල් රෙගුලාසිවල විධිවිධාන වලට අනුව කටයුතු කළ යුතුය. මේ සම්බන්ධයෙන් පූර්ණ විධිමත් විමර්ශනයක් සිදුකර වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියාමාර්ග ගත යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව මිල ගණන් කැඳවීමකින් තොරව සුභසාධක සංගමය විසින් ආයුර්වේද කොමසාරිස්වරයාගේ යෝජනාවක් අනුව රු.28,945,285 ක වියදමින් මෙම ප්‍රදර්ශනය කළමනාකරණය කිරීම සඳහා මහනුවර පිළිමතලාව ප්‍රදේශයේ පුද්ගලික සමාගමක් ඉසව් කළමනාකරණ ආයතනය ලෙස තෝරා ගෙන තිබුණි. මෙම ගිවිසුමට එළඹෙන විට සුභසාධක සංගම් ගිණුමේ රු.836,948ක් පමණක් පැවතීම මතභේදයට තුඩුදෙන කරුණකි.	-එම-	-එම-

(ඇ)	ඉසව් කළමනාකරණ ආයතනයට චෙක්පත් වලින් සෘජුවම මුදල් ගෙවීමට හැකියාව තිබියදී අවස්ථා 03කදී ආයුර්වේද කොමසාරිස් ජනරාල්වරයාගේ වාචික හා ලිඛිත උපදෙස්මත රු.10,881,642 ක් බැංකුවෙන් මුදල් ලබාගෙන අදාළ ආයතනයේ ගිණුමට තැන්පත් කර තිබුණි.	-එම-	-එම-
(ඈ)	සුහසාධක සංගමය විසින් රු.1,820,430ක් සත්‍ය වශයෙන්ම වැයකළ බව සනාථ කිරීම සඳහා වූ ලේඛන කිසිවක් විගණනයට ඉදිරිපත් කිරීමට හැකිව නොතිබුණි.	-එම-	-එම-
(ඉ)	2023 සැප්තැම්බර් මස 10 දින මෙම ප්‍රදර්ශනය පවත්වා නිම වුවද, 2023 දෙසැම්බර් 01 දින පුද්ගලික ආයතනයක් විසින් රු.110,000ක මුදලක් සුහසාධක සංගමය වෙත ලබාදී තිබුණි.	-එම-	-එම-
(ඊ)	2024 අප්‍රේල් 01 දින රු.422,000ක්, 2024 අප්‍රේල් 30 දින රු.474,000ක්, 2024 මැයි 05 දින රු.11,000ක් වශයෙන් එකතුව රු.907,000ක මුදලක් බාහිර පාර්ශවයන් විසින් සුහසාධක සංගමයේ ජංගම ගිණුමට බැර කර තිබුණු බව සංගමයේ මුදල් පොත අනුව අනාවරණය විය. ඊට අදාළ තොරතුරු සුහසාධක සංගමය සතු නොවූ අතර ආයුර්වේද කොමසාරිස්වරයාගේ වාචික උපදෙස් මත 2024 අප්‍රේල් 24 දින හා 2024	-එම-	-එම-

	මැයි 02 දින මුදල් චෙක්පත් මඟින් පුද්ගලයෙකු හට රු.896,000ක් ගෙවා තිබුණු අතර එම ගෙවීමට අදාළ තොරතුරු සුභසාධක සංගමය සතු නොවීය. මේ අනුව කොමසාරිස් ජනරාල්වරයා විසින් සුභසාධක සංගමයට අයත් නොවූ කාර්යයන් වෙනුවෙන් අවිධිමත් ආකාරයෙන් මුදල් රැස්කිරීමට හා වියදම් කිරීම සඳහා මෙම සුභසාධක සංගම් ගිණුම භාවිතා කර තිබුණි.		

3.8 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

අනාවරණය වූ විගණන නිරීක්ෂණ සඳහන් කරන්න.

	විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ 21.3 වගන්තිය ප්‍රකාරව, වැඩ තහනමට ලක්වූ නිලධාරීන් සම්බන්ධයෙන් පැවැත්වෙන විනය පරීක්ෂණ කටයුතු හැකිතාක් අප්‍රමාදව අවසන් කිරීම අත්‍යාවශ්‍ය වුවද, 2020 වර්ෂයේ වැඩ තහනමට ලක් වූ එක් නිලධාරියෙකුගෙන් රු. 10,855 ක් ද, වර්ෂ 20 ක කාලයක් ඉක්මවා තිබුණු නිලධාරීන් 03 දෙනෙකුගෙන් රු. 87,610 ක් ද, අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි.	පෙන්වා දී ඇති කරුණ පිළි ගන්නා බව, අයකර ගැනීමට අදාළව නීතිමය කටයුතු සිදුකිරීමට ලේකම් වෙත යොමු කර ඇති බව, රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක.01/2024 අනුව කටයුතු කිරීම සඳහා ඉදිරිපත් කළ ද තවදුරටත් ණය නිරවුල් කිරීමට පියවර ගන්නා ලෙස උපදෙස් ලැබී ඇති බැවින් ඒ අනුව කටයුතු කරන බව.	පසු විපරම් කිරීම හා ප්‍රමාණවත් අධීක්ෂණය මඟින් ණය අයකර ගැනීම කඩිනම් කළ යුතුය.

(ආ)	ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 4.2.4 වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව නිලධාරියෙකු විශ්‍රාම ගැනීමට නියමිතව ඇති කල්හි ඔහුගෙන් අයවිය යුතු සියළුම ණය පිළිබඳ විස්තර විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතු අතර, 4.2.5 වගන්තිය ප්‍රකාරව නිලධාරියාගේ පරිවර්තිත විශ්‍රාම වැටුපෙන් හෝ පාරිතෝෂිත මුදල් වලින් හෝ අයකර ගත යුතුය. නමුත් 2024 දෙසැම්බර් 31 දිනට විශ්‍රාමගොස් වසර 02ක් ඉක්ම වූ නිලධාරීන් 03 දෙනෙකුගෙන් අයවිය යුතු රු.253,200 ක්ද, වසර 06කට වඩා පැරණි විශ්‍රාම ගිය නිලධාරින් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.181,160ක්ද , වසර 20 කට වඩා පැරණි විශ්‍රාම ගිය නිලධාරීන් 03 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 52,050 ක්ද විය.	මෙම නිලධාරීන් මෙතෙක් විශ්‍රා ගන්වා නැති බව, විශ්‍රාම ගැන්වීම ද අවිනිශ්චිත බව, එබැවින් ගෙවීම් කරන ලෙස දන්වා ඇති බව, රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක.01/2024 අනුව කටයුතු කිරීම සඳහා ඉදිරිපත් කළ ද තවදුරටත් ණය නිරවුල් කිරීමට පියවර ගන්නා ලෙස උපදෙස් ලැබී ඇති බැවින් ඒ අනුව කටයුතු කරන බව.	මෙම හිඟ ණය මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	2019 ජුනි 27 දිනැති අංක 05/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3(ඉ)(ii) ප්‍රකාරව සේවය හැර ගිය නමුත් නැවත සේවයේ පිහිටුවා නොතිබුණු නිලධාරීන්ගේ ජාතික හැඳුනුම්පත් අංකය මැතිවරණ කොමසාරිස් වෙත ඉදිරිපත් කර පදිංචිය පිළිබඳව විස්තර විමසා ප්‍රාදේශීය ලේකම් මගින් එම නිලධාරීන්ගේ වත්කම් පිළිබඳව තහවුරුවක් ලබා ගැනීමෙන් අනතුරුව නීතිපති මගින් ණය මුදල අයකර ගත යුතු වුවද, 2024 දෙසැම්බර් 31 දින වන විට සේවය හැරගිය	පෙන්වා දී ඇති කරුණ පිළි ගන්නා බව, අයකර ගැනීමට අදාළව නීතිමය කටයුතු සිදුකිරීමට ලේකම් වෙත යොමු කර ඇති බව, රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක.01/2024 අනුව කටයුතු කිරීම සඳහා ඉදිරිපත් කළ ද තවදුරටත් ණය නිරවුල් කිරීමට පියවර ගන්නා ලෙස උපදෙස් ලැබී ඇති බැවින් ඒ අනුව කටයුතු කරන බව.	-එම-

	වර්ෂ 01ක් වර්ෂ 03ක් අතර කාලයක් ගතවී තිබුණු නිලධාරින් 06 දෙනෙකුගෙන් රු. 261,176ක්ද**,** වර්ෂ 05ක් වර්ෂ 10ත් අතර කාලයක් ගත වී තිබුණු නිලධාරීන් 06 දෙනෙකුගෙන් රු. 502,630ක්ද **,**වර්ෂ 20ක් ඉක්මවා තිබුණු නිලධාරින් 10 දෙනෙකුගෙන් රු. 259,480ක්ද**,** අයකර ගෙන නොතිබුණි.		
(ඇ)	ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5, 4.6 හා 6.3 වගන්තිය හා 2019 ජුනි **27** දිනැති අංක 05/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛනයෙහි 03 **(**ආ**)** ඡේදය**,** 2017 දෙසැම්බර් 29 දිනැති අංක 262/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛනයෙහි 04 ඡේදය ප්‍රකාරව මියගිය නිලධාරීන්ගේ ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වුවත්**,** මියගොස් 2024 දෙසැම්බර් 31 දිනට මාස 06 කට වැඩි කාලයක් ගතවී තිබුණු නිලධාරීන් 09 දෙනෙකුගෙන් අයවිය යුතු මුළු ණය ශේෂය රු.616,040 ක් විය. එම ණය ශේෂ අතරින් රු. 112,250ක් වසර 20කට පෙර මිය ගිය නිලධාරීන් දෙදෙනෙකුටද**,** රු. 17,850 ක් වසර 10කට පෙර මිය ගිය නිලධාරීන් දෙදෙනෙකුටද, රු. 154,200ක් වසර 01ත් **05**ත් අතර කාලයකට පෙර මිය ගිය නිලධාරීන් දෙදෙනෙකුට හා රු.2,500 ක් මාස 06 ඉක්මවූ එක් නිලධාරියකුට අදාළ ණය ශේෂ විය.	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක.01/2024 අනුව කටයුතු කිරිම සඳහා ඉදිරිපත් කළ ද තවදුරටත් ණය නිරවුල් කිරිමට පියවර ගන්නා ලෙස උපදෙස් ලැබී ඇති බැවින් ඒ අනුව ඉදිරි කටයුතු කරමින් පවතින බව**,** මරණ පාරිතෝෂිකයෙන් අය කිරිමට කටයුතු සිදු කරන බව.	ආයතන සංග්‍රහය හා අදාල මුදල් චක්‍රලේඛය පරිදි කටයුතු කළ යුතු අතර පෞද්ගලික ලිපිගොණුවල ආරක්ෂාව සම්බන්ධයෙන් නොසැලකිලිමත්ව කටයුතු කළ නිලධාරීන්ගෙන් අදාළ මුදල අයකර ගැනීමට මුදල් රෙගුලාසි 104 (2) **"**ආ**"** ප්‍රකාරව කටයුතු කළ යුතුය.

(ඉ)	අංක 05/2019 හා 2019 ජුනි 27 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම යටතේ ස්ථාන මාරු වීම් යන / එන නිලධාරීන්ට අදාළ ණය ශේෂ, ණය මුදල් ගෙවා අවසන් වීමට පෙර විශ්‍රාම ගොස් සිටින හා මියගොස් ඇති සේවකයින්ගේ ණය ශේෂ, ණය මුදල් ගෙවා අවසන් වීමට ප්‍රථම සේවයෙන් මුදා හරින ලද සේවකයන්ට අදාළ ණය ශේෂ හා කල්ගත වු ණයශේෂ අයකර ගැනීමට හා නිරවුල් කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	අංක 05/2019 හා 2019 ජුනි 27 දිනැති රා.මු.ච උපදෙස් අනුව පැරණි ණය ශේෂ සඳහා ඉහත ජේද අංක 02 සිට 07 දක්වා ඇති කරුණු අනුව කටයුතු කර ඇති අතර වර්තමානයේ දී පවතින ණය ශේෂ සඳහා (ස්ථාන මාරු, විශ්‍රාම ගිය, මිය ගිය, වැඩ තහනම් වු , සේවය හැර ගිය,) කඩිනමින් අයකර ගැනීමට කටයුතු කර ඇති බව.	චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කිරීමට ප්‍රමාණවත් තොරතුරු අනාවරණය කර ගැනීමට නොහැකි විම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඔවුන්ගෙන් මෙම මුදල අයකර ගැනීමට මුදල් රෙගුලාසි 104 (2) "ආ" ප්‍රකාරව කටයුතු කළ යුතුය.

3.9 තැන්පත් ශේෂයන්

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
තෙවන පාර්ශවයන් වෙත ආපසු ගෙවීමට යටත්ව තාවකාලිකව රදවා ගන්නා ලද කේවල ශේෂ ලැයිස්තුවෙහි තැන්පත්කරුගේ/ ආයතනයේ නම හඳුනාගත හැකි ආකාරයට පවත්වාගෙන ගොස් නොතිබුණු අවස්ථා 26ක් වු අතර එහි වටිනාකම රු.1,488,160ක් විය.	විගණනය විසින් පෙන්වා දී ඇති කරුණු සම්බන්ධයෙන් එකඟ වන බව, මුදල් භාර ගැනීමේ කුවිතාන්සියේ මුදල් ගෙවෙන අයගේ නම නිවැරදිව සටහන් නොවීම නිසා මෙම අතපසුවීම සිදුවී ඇති බව, සරප් ඇතුළු අදාළ සියලුම නිලධාරීන්ට උපදෙස් ලබා දී ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් ඇති නොවීමට අදාළ ක්‍රියාමාර්ග ගෙන ඇති බව.	මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කල් ඉකුත් වූ තැන්පතු නියාදනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන 2001 වර්ෂයේ සිට 2005 වර්ෂය දක්වා නියමු ව්‍යාපෘතියක් ලෙස අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කර එහි සාර්ථකත්වය අනුව 2005 වර්ෂයේ සිට අනෙකුත් දිස්ත්‍රික්ක සඳහා සේවා ව්‍යාප්ත කළ යුතු වුවද, අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පමණක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා 2005 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා රු.මිලියන 877.2 ක් වැය කර තිබුණි. නමුත් 2022 වර්ෂයේ සිට වෙනම එම ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන සලසා නොගෙන සංවර්ධන වැඩසටහනේ රෝගී ප්‍රතිකාර සේවා ව්‍යාපෘතිය යටතේ වැටුප්, දීමනා, ගිවිසුම්ගත සේවා ඇතුළු පුනරාවර්තන වියදම් සඳහා පමණක් ප්‍රතිපාදන සලසා ගෙන සමාලෝචිත වර්ෂයේ නිලධාරීන් 205දෙනෙකුට වැටුප් දීමනා හා අනෙකුත් වියදම් සඳහා රු.මිලියන 173.7ක් වැයකර තිබුණි. ඒ අනුව අනෙකුත් දිස්ත්‍රික්ක ආවරණය කරමින් ව්‍යාප්ත කිරීමට තරම් සාර්ථකත්ව ක්‍රියාත්මක නොවූ මෙම ව්‍යාපෘතියට අදාළ පුනරාවර්තන වියදම් පමණක්	පෙන්වා දී ඇති කරුණු සමඟ එකඟ වන බව, 2005 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය අවසන් කළ යුතු වුවද එලෙස අවසන් නොකර භාණ්ඩාගාරය විසින් ලබා දෙන ලද ප්‍රතිපාදන මත මෙම ව්‍යාපෘතිය අඛණ්ඩව ඉදිරියට පැමිණ ඇති බව, එම ව්‍යාපෘතිය තුළ වෛද්‍ය නිලධාරීන් 22ක් හා ප්‍රජා සෞඛ්‍ය සංවර්ධන නිලධාරීන් 210ක් අනුයුක්ත කර ඇති බව, මේ පිළිබඳව දිගින් දිගටම විගණනයෙන් සිදු කරන ලද පෙන්වා දීම් භාණ්ඩාගාරය වෙත හා ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත වාර්තා කරන ලද බව, ඒ අනුව මේ වන විට අදාළ ව්‍යාපෘතිය අවසන් කර ඇති බව, නමුත් ව්‍යාපෘතිය භාර දීම සිදු කර නැති බව, අදාළ නිලධාරීන්ගේ වැටුප් හා වේතන හා කාර්යාල පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන භාණ්ඩාගාරය වෙතින් 2025 වර්ෂය සඳහා ද වෙන් කර ඇති බව, ඉදිරියේදී තව දුරටත් අදාළ පාර්ශව සමඟ සාකච්ඡා කර ඉදිරි පියවර ගැනීමට සටහන් කරගෙන ඇති බව.	ව්‍යාපෘති කාලසීමාව අවසන්ව ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවේ නම් එය සතුව පැවැති භෞතික හා මානව සම්පත් දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටුකර ගැනීමට හෝ උතුරු මැද පළාත් සභා මට්ටමින් ක්‍රියාත්මක වන ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය සේවාවට සඳහා යොදා ගැනීමට අවශ්‍ය ප්‍රතිපත්තිමය අනුමැතීන් ලබාගෙන ඒ අනුව ව්‍යාපෘති කාර්යාල නඩත්තුව හා කාර්ය මණ්ඩල සඳහා දරන වියදම් සීමා කර ගැනීමට කටයුතු කළ යුතුය.

	දෙපාර්තමේන්තුවේ වැය විෂයයන් මගින් ආවරණය කරමින් ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන තව දුරටත් පවත්වාගෙන යාමට කටයුතු කිරීම මතභේදයට තුඩුදෙන කරුණකි.		
(ආ)	ආයුර්වේද දෙපාර්තමේන්තුව හා එහි අනුබද්ධ ආයතන, රෝහල්, වෛද්‍ය මද්‍යස්ථාන ඇතුළු සම්පූර්ණ ආයතන පද්ධතියම ඇතුළත්වන පරිදි කළමනාකරණ තොරතුරු පද්ධතියක් (MIS) සැකසීම සඳහා 2021 වර්ෂයේ මෙන්ම 2022 වර්ෂයේදීද රු.මිලියන 25 බැගින් ප්‍රතිපාදන සලසාගෙන තිබුණු නමුත් එම කාර්යය සමාලෝචිත වර්ෂයේදීද ඉටුකර නොතිබුණි.	2021 හා 2022 වර්ෂවලදී මෙම කාර්යයෙන්ම සිදුකිරීම සඳහා ප්‍රතිපාදන වෙන් වී තිබුණද සමාලෝචිත වර්ෂයේ සඳහා ප්‍රතිපාදන වෙන් වී නොතිබුණු බව, එහෙයින් සමාලෝචිත වර්ෂයේදී කළමනාකරණ තොරතුරු පද්ධතියක් සැකසීම ඉටු කිරීමට නොහැකි වූ බව, කෙසේ වුවද 2025 වර්ෂය තුළ අදාළ කටයුතු ඉටු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතින බව.	දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රය, රෝහල්, ඔසු උයන්, ප්‍රජා සෞඛ්‍ය ප්‍රාදේශීය කාර්යාල, යනාදී සියළුම අංශවල කටයුතු සම්බන්ධිකරණය කළ හැකි කළමනාකරණ දත්ත පද්ධතියක් ස්ථාපිත කළ යුතුය.
(ඇ)	ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සමාලෝචිත වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම මගින් ශාරීරික සුවතා මධ්‍යස්ථාන ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 100ක ප්‍රතිපාදන වෙන්කරවා ගෙන තිබුණද එම කාර්යය ඉටු කර නොතිබුණි.	ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මගින් ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවට අදාළව ක්‍රියාත්මක කළ යුතු ව්‍යාපෘතියක් සඳහා අනුමත කර තිබිණු බව, ඒ අනුව ව්‍යාපෘතිය ආයුර්වේද ඖෂධ සංස්ථාව සමඟ එක්ව ක්‍රියාත්මක කිරීමේදී ප්‍රතිපාදන පැවරීම පිළිබඳව ගැටලු සහගත තත්ත්වය ඇති වීම මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම අත්හිටුවන ලද බව, තවද එම ව්‍යාපෘතියේ වත්කම් ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් ලබා දී තිබූ උපදෙස් අනුව පැවැති ගැටළුකාරී තත්ත්වය මහා භාණ්ඩාගාරයේ සියලුම අදාළ දෙපාර්තමේන්තු සමඟ සාකච්ඡා කළද විසඳුම ලබාගත නොහැකි වූ බැවින් ව්‍යාපෘතිය සැලසුම් කළ පරිදි ඉටු කිරීමට නොහැකි වූ බව.	වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම ප්‍රකාරව කටයුතු කළ යුතුය.

(ඇ)	සමාලෝචිත වර්ෂයේ දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනයෙහි නේවාසිකාගාරයේ පහසුකම් වැඩිදියුණු කිරීම, දේශනශාලා ප්‍රායෝගික පරික්ෂණ ශාලා වැඩිදියුණු කිරීම, පුස්තකාලය හා ගොඩනැගිල්ල වැඩි දියුණු කිරීම යන කාර්යයන් සඳහා රුපියල් මිලියන 04ක ප්‍රතිපාදන වෙන්කරවා ගෙන තිබුණද, රුපියල් මිලියන 4.68ක් වැය කර ආයතනයේ නේවාසිකාගාර පහසුකම් වැඩිදියුණු කිරීම පමණක් සිදුකර තිබුණි.	අදාළ කාර්යයන් නිමකිරීම සඳහා වියදම් ඇස්තමේන්තු කිරීමේදී ලැබී ඇති ප්‍රතිපාදන සීමා සහිත වීම නිසා ප්‍රමුඛතා මත අත්‍යවශ්‍යම ව්‍යාපෘතියක් ඉටු කිරීම සඳහා තෝරාගැනීමට සිදුවු බව, මෙහිදී ආයතනයේ පැවැත්වෙන පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වන පුහුණු ලාභීන් නේවාසිකාගාරය භාවිතා කරන බැවින් එහි පහසුකම් වැඩි දියුණු කිරීම ප්‍රමුඛ කාර්යයක් ලෙස සලකා නේවාසිකාකාරයේ නාන කාමර වැඩිදියුණු කරන ලද බව.	**-එම-**

4.2 ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ හා සංස්කෘතික දෙපාර්තමේන්තුවේ අරමුණු යටතට ගැනෙන කාර්යයක්වූ හිසතෙල් ගෑමේ රාජ්‍ය උත්සවයට සමගාමීව මෙම කාර්යය සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් රු.4,910,611ක් වැය කර තිබුණි.	මෙම විමසුම සඳහා එකඟ විය නොහැකි බව, සිංහල හා දමිළ අලුත් අවුරුද්ද සංස්කෘතික කාර්යයක් බව, එහි එන හිසතෙල් ගැල්වීමේ චාරිත්‍රය ශ්‍රී ලංකාවේ දේශීය වෛදකමට ඍජුවම අදාළ කාර්යයක් බව, ඒ අනුව, දශක හතරකට ආසන්න කාලයක් ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් හිස තෙල් ගැල්වීමේ රාජ්‍ය උත්සවය සිදු කර ඇති බව, මෙම උත්සවයෙහි පරමාර්ථය සියලු ජනතාවගේ නීරෝගී භාවය හා එහි වටිනාකම පිළිබඳව ආකල්පමය වෙනසක් වසර ආරම්භයේදීම ඇති කිරීම බව.	එකම කාර්යය සඳහා ආයතන/ අමාත්‍යාංශ දෙකක් වියදම් සිදු නොකළ යුතුය.

4.3 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2020 අගෝස්තු 28 දිනැති හා 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රවර්ථන වර්ෂයේ දෙසැම්බර් 10 දිනට පෙර සකස් කොට ඒ සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබාගෙන එහි පිටපත් විගණකාධිපති වෙත එවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදීත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.	ප්‍රසම්පාදන සැලැස්ම 2023 වර්ෂයේදී සෞඛ්‍ය ලේකම්ගේ අනුමැතියට යොමු කර ඇති අතර සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්ම සඳහා 2024 අගෝස්තු 08 දිනැතිව අනුමැතිය ලැබී ඇති බව.	රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ආ)	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම හා සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබා නොතිබුණි.	අනුමැතිය ලබා ගෙන ඇති බව.	-එම-
(ඇ)	2024 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මෙහි ජාතික තරඟකාරී මිල සැදැහුම් ක්‍රමය යටතේ කාර්යාලීය ගෘහභාණ්ඩ මිලදී ගැනීමට තීරණය කර තිබුණද, නිසි අනුමැතියකින් තොරව වෙළඳපල මිල සැදැහුම් ක්‍රමය යටතේ මිලදී ගැනීමට කටයුතු කර තිබුණි. මෙහිදී,		
	(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6.1(v) ප්‍රකාරව කටයුතු කිරීමෙන් තොරව තාක්ෂණික	ශ්‍රී ලංකාවේ ලී බඩු හා කාර්යාලීය උපකරණ නිෂ්පාදනය හා අලෙවිය සම්බන්ධයෙන් වැඩි ප්‍රසිද්ධියක් උසුලන හා සැපයීම් හැකියාව සලකා බලා	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

	පිරිවිතරයන්ට අනුකූලතාවය දක්වා ඇති ලංසුකරුවන් දෙදෙනාගෙන් රු.3,174,200ක් වූ අවම ලංසුව ඉදිරිපත් කරන ලද ආයතනය සතුව නිම කරන ලද භාණ්ඩ නොමැති බවට දුරකථනයෙන් ලබා ගන්නා ලද තොරතුරු මත පදනම්ව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් මෙම ලංසුව ප්‍රතික්ෂේප කර තිබුණි.	අදාළ ආයතන 7 ක් මගින්, එම ආයතන වලට සාධාරණ අවස්ථාවක් සලසා දෙමින් ප්‍රමාණවත් තරඟකාරී මිලක් යටතේ මෙම උපකරණ මිලදී ගැනීමට සැලසුම් කරන ලද බව, එහෙත් ආයතන 04 ක් පමණක් ප්‍රතිචාර දක්වන ලද අතර, තාක්ෂණික ඇගයීම් කමිටුවේ සුදුසුකම්ලත් තාක්ෂණික නිලධාරියකුගේ සහය ඇතිව ලංසු ඇගයීම කටයුතු සිදු කර ඇති බව, ඒ අනුව ඔවුන්ගේ නිර්දේශ සලකා බලා අදාළ භාණ්ඩ ඇණවුම් කිරීමට ප්‍රථම, ඒවායේ අවශ්‍යතාවයට උචිත බව හා ගුණාත්මකභාවය ද, ගෙවන මුදලට ප්‍රමාණවත් වටිනාකමක් ඇත් ද යන කරුණු සලකා බලා දෙවන අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතනයේ භාණ්ඩ පරීක්ෂාවට ලක් කර ඇති බව, මෙම පරීක්ෂාව මා විසින් පත්කල කමිටුවක් මගින් සිදුකර ඇති බව.භාණ්ඩ වල අනුරූප වෙළඳපොලේ නිමකර ඇති ආයතන වල භාණ්ඩ බැවින් Model no. භාවිතා කරමින් ඒ සම්බන්ධව අන්තර්ජාලය හා ප්‍රදර්ශනාගාර තුළින් පරීක්ෂා කර බලා ඇති බව.	
(ii)	තාක්ෂණික පිරිවිතරයන්ට අනුව සියලුම භාණ්ඩ සඳහා වසර 03ක වගකීම් කාලයක් අවශ්‍ය බව දක්වා තිබියදී, වසරක හා වසර 02 ක වගකීම් කාලයක් සහිත ආයතන 02 ක් වෙතින් රු.6,062,494 ක් වූ කාර්යාලීය	-එම-	තාක්ෂණික පිරිවිතරයන්ට අනුව මිලදී ගැනීමට කටයුතු කළ යුතුය.

	ගෘහභාණ්ඩ මිලදී ගැනීමට කටයුතු කර තිබුණි.		
(iii)	තාක්ෂණික පිරිවිතරයන්ට අනුව වසර 03ක වගකීම් කාලයක් තිබිය යුතු වුවත් වසරක වගකීම් කාලයක් සහිත හා ලංසු ලේඛන ප්‍රකාරව වානේ ඝණත්වය මි.මි. 0.8 - මි.මි. 0.7ක්වූ Workmen Locker සැපයීය යුතු වුවත් සැපයීමේදී වානේ ඝණත්වය මි.මි. 0.6ක්වූ අඩු වානේ ඝණත්වය සහිත Workmen Locker සපයා තිබුණි.	මේ පිළිබඳව අදාළ ආයතනය වෙතින් විමසීමේදී ලංසු ඉදිරිපත් කරන අවස්ථාවේදී පැවති මිල භාණ්ඩ ඇනවුම් කරන අවස්ථාව වන විට වැඩි වී ඇති නිසා ඔවුන්ගේ දත්ත පද්ධති තුළ නව මිල ගණන් ඇතුළත් වන බැවින් 10% ක වට්ටමක් ලබා දී ලංසු ඉදිරිපත් කර ඇති මිලට සැපයීමට කටයුතු කර ඇති බව සඳහන් කරන ලද බව.	තාක්ෂණික පිරිවිතරයන්ට හා ලංසු ලේඛන ප්‍රකාරව භාණ්ඩ භාරගැනිමට කටයුතු කළ යුතුය.
(ඇ)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට පටහැනිව මිල කැඳවීමකින් තොරව ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත සෘජුව ආයුර්වේද දෙපාර්තමේන්තු කාර්යාල ගොඩනැගිල්ලේ වහලය අලුත්වැඩියා කිරීමට ලබා දී තිබුණි. මෙම අලුත්වැඩියාව සඳහා සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය රු.44,900,000ක ප්‍රතිපාදන ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත වෙන් කරවා දී තිබුණි. මෙහිදී,		
(i)	නෛතික ගිවිසුමකින් තොරව රුපියල් මිලියන 44.9ක්වූ උක්ත කාර්යය ගොඩනැගිලි	දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු හා තාක්ෂණික නිළධාරීන් පුරප්පාඩු වී ඇති බැවින් රජයේ මුදල් රෙගුලාසි 208 ප්‍රකාරව නියෝජිත ආයතනයක් ලෙස කටයුතු	දෙපාර්තමේන්තුවේ කාර්යයක් බැවින් නෛතික ගිවිසුමකට එළඹීමට කටයුතු කළ යුතුය.

	දෙපාර්තමේන්තුව වෙත පවරා තිබුණි.	කිරීම සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත අදාළ කාර්යය පවරා ඇති බව, මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂ මගින් සිදුකළ බැවින් අදාළ ප්‍රතිපාදන පැවරීම සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ම සිදුකර ඇති බව.	
(ii)	ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් උක්ත කාර්ය සිදු කරවා ගැනීමට උප කොන්ත්‍රාත් පිරිනමා තිබුණද, ඊට අදාළ ගිවිසුමෙහි පිටපත් ආයුර්වේද දෙපාර්තමේන්තුව සතු නොවූයෙන් ගිවිසුමේ කොන්දේසි, නිමකළ යුතු දිනය, කාල ප්‍රමාදයන් සඳහා අයකිරීම්, හානි පුරණයන් සම්බන්ධ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය.	මේ සම්බන්ධයෙන් පූර්ණ අධීක්ෂණයක් දෙපාර්තමේන්තුව මඟින් සිදු කළ අතර අවශ්‍ය සියලුම සාකච්ඡාවන් සිදුකරමින් කාර්ය නිමකර ගැනීම සඳහා පසු විපරම් කටයුතු සිදු කළ බව,	ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(iii)	අදාළ පරිශ්‍රයේ භාණ්ඩවල ආරක්ෂාව තහවුරු කර වහල අලුත්වැඩියා කාර්ය සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ උප කොන්ත්‍රාත් සමාගම වෙත පිරිනැම්ම සිදුකළ යුතු වුවද, එසේ නොකිරීම හේතුවෙන් වැසි ජලය වැටීමෙන් රු.1,124,708ක්වූ	මේ සම්බන්ධයෙන් මු.රෙ.104 පරීක්ෂණය සිදු කෙරෙමින් පවතින බව, අදාළ වාර්තාව ලැබුණු පසු විගණයට ඉදිරිපත් කිරීමට සටහන් කර ගත් බව.	අදාළ සියලුම නිලධාරින් වෙතින් අධිභාර කිරීමට කටයුතු කළ යුතුය.

	ගෘහ භාණ්ඩ හා උපකරණ නැවත භාවිතයට ගත නොහැකි තත්ත්වයට පත්ව තිබුණි. උප කොන්ත්‍රාත් සමාගම විසින් මෙම අලාභ මුදල ගෙවනු නොලබන බැවින්, මුදල් රෙගුලාසි 104 (2) "ආ" පරිදි නෛතික ගිවිසුමකට එළඹීමට කටයුතු නොකළ හා අදාළ භාණ්ඩවල ආරක්ෂාව තහවුරු නොකළ සියලුම නිලධාරීන් වෙතින් අධිභාර කිරීමට කටයුතු කර නොතිබුණි.		
(ඉ)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට පටහැනිව මිල කැඳවීමකින් තොරව ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව වෙතින් පමණක් ඖෂධ මිලදී ගනු ලබන බව නිරීක්ෂණය විය. 2023 වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී පමණක් පිළිවෙලින් රු.53,731,570ක් හා රු.126,583,034ක් වටිනා ඖෂධ මිලදී ගෙන තිබුණි. 2023 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මිලදී ගැනීමේ පිරිවැය සියයට 136ක ප්‍රතිශතයකින් ඉහල ගොස් තිබුණි.	ආයුර්වේද ඖෂධ නිෂ්පාදනයේ රජයට සම්බන්ධ ප්‍රධානම ආයතනය ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව වන බැවින් ආයුර්වේද දෙපාර්තමේන්තුව වෙත අවශ්‍ය සියළුම නිමි ඖෂධ එම ආයතනය වෙතින් මිලදී ගෙන ඇති බව, එම ආයතනය විසින් රාජ්‍ය අංශය සඳහා නිකුත් කර ඇති මිල ගණන් යටතේ ආයුර්වේද රොහල් සඳහා අවශ්‍ය නිමි ඖෂධ මිලදී ගෙන ඇති බව, තව ද 2025.02.25 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අංක 25/0217/815/018 මගින් 2025,2026 හා 2027 වර්ෂ සඳහා ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව වෙතින් සෘජු මිලදී ගැනීම් යටතේ ආයුර්වේස ඖෂධ මිලදී ගැනීම සඳහා අනුමැතිය ලැබී ඇති බව.	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.

4.4 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අවශ්‍යතාවය නිසියාකාරව හඳුනා ගැනීමෙන් තොරව දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගබඩාව විසින් මිලදී ගැනීම හේතුවෙන් රසායන ද්‍රව්‍ය, පොලිතින්, වියලි ඖෂධ ද්‍රව්‍ය අයිතම 05 කට අදාළව ලීටර් 217ක්, අයිතම 07 කට අදාළව ඒකක 5,043 ක් හා අයිතම 18 කට අදාළව කිලෝග්‍රෑම් 312 ක් හා අයිතම 44 කට අදාළව පොත් ඒකක 13,598ක තොග චලනය නොවන හා ඉතා සෙමෙන් චලනය වන්නාවූ තත්ත්වයේ පැවතුණි.	විගණන නිරීක්ෂණය සමඟ එකඟ වන බව.	අවශ්‍යතාවය නිසි පරිදි හඳුනාගෙන මිලදී ගැනීමට කළ යුතුය.
(ආ)	විධිමත් නිකුතු නියෝග ලබා දීමෙන් තොරව වාචික උපදෙස් මත ගබඩා භාරකරු විසින් 2019 වසරේ සිට 2024 ජුනි 20 දින දක්වා වූ කාලය තුළ පොත් ගබඩාවෙන් අවස්ථා 27කට අදාළව පොත් ඒකක 4,252ක් නිකුත් කර තිබුණි.	පෙන්වා දී ඇති කරුණු පිළිගන්නා බව, මේ වන විට මෙම තත්ත්වය නිවැරදි කර ඇති බව, අදාළ අංශයේ ඉල්ලීම් ලිපිය හා විධිමත් අනුමැතියක් සහිතව එම පොත් නිකුත් කර ඇති බව.	සියළුම නිකුත් කිරීම් වෙනුවෙන් නිකුත් නියෝග ලබාදිය යුතුය.
(ඇ)	බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය විසින් 2015 වර්ෂයේදී රු. මිලියන 23.56ක් වැය කර මිලදී ගන්නා ලද ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ වර්ග 38 කට අදාළව ඒකක 97 ක් නිශ්කාර්යව පැවතුණි.	කළමනාකරණ විගණන කමිටු රැස්වීමේදී ලබාදුන් උපදෙස් පරිදි මෙම උපකරණ සෞඛ්‍ය අමාත්‍යාංශයේ මාධ්‍ය අංශය වෙත ලබාදීමට අනුමැතිය ලබා ගැනීම සඳහා 2025.04.03 දිනැති ලිපිය සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කර ඇති බව, ඒ අනුව ඉදිරි කටයුතු කර වාර්තා කරන බව.	අවශ්‍යතාවය නිසි පරිදි හඳුනාගෙන මිලදී ගැනීමට කළ යුතුය.

(ඇ)	ආයුර්වේද පර්යේෂණ රෝහල්, ශික්ෂණ රෝහල්, සංචාරක නිවාස හා ඔසු උයන් විසින් නිවැරදිව, තොග පොත් / ලේඛන / ඉන්වෙන්ට්‍රි පොත් යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණු අතර පරිත්‍යාග පිළිබඳ තොරතුරු ප්‍රධාන කාර්යාලය වෙත වාර්තා නොකිරීම හේතුවෙන් ප්‍රධාන කාර්යාලීය ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යාමට නොහැකි වී තිබුණි.	මේ සම්බන්ධයෙන් සියලුම ආයතන ප්‍රධානීන් දැනුවත් කර ඇති බව, මේ වන විට සියලුම ප්‍රදාන මගේ අනුමැතියෙන් පසු භාරගන්නා අතර අදාළ ලේඛන ප්‍රධාන කාර්යාලයට ඉදිරිපත් කිරීමෙන් පසු ගිණුමගත කිරීමට කටයුතු සම්පාදනය කර ඇති බව.	තොග පොත් / ලේඛන / ඉන්වෙන්ට්‍රි පොත් යාවත්කාලීනව පවත්වාගෙන යාමට හා පරිත්‍යාග පිළිබඳ තොරතුරු ප්‍රධාන කාර්යාලය වෙත වාර්තා කිරීමට කටයුතු කළ යුතුය.
(ඉ)	නාවින්න බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනයේ, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ශික්ෂණ රෝහලේ හා පල්ලේකැලේ පර්යේෂණ හා ව්‍යාප්ත සේවා ඔසු උයනෙහි ඉතා වටිනා ශාඛ හා දුර්ලභ ඖෂධීය ශාඛ පිළිවෙලින් 49ක්, 05ක් හා 05ක් නිසි අනුමැතියකින් තොරව කපා ඉවත් කර තිබුණි.	මේ සම්බන්ධව ආයුර්වේද දෙපාර්තමේන්තුව දැනුවත් කර ඒ සඳහා අනුමැතිය ලබාගෙන මෙම කාර්ය සඳහා බලය ඇති ආයතන මගින් විධිමත් ක්‍රමවේදය අනුගමනය කරමින් ගස් ඉවත් කිරීම සිදුකර ඇති බව.	අවශ්‍යතාවය නිසි පරිදි හඳුනාගෙන නිසි අනුමැතියක් ලබා විධිමත් ක්‍රමවේද ප්‍රකාරව කටයුතු කළ යුතුය.

4.5 රජයේ නිලධාරීන් ඇප තැබීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
මුදල් රෙගුලාසි 892 ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන්ගේ සංශෝධිත වාර්තාවක් සෑම වර්ෂ 03 ක් අවසානයට පසුව යෙදෙන පෙබරවාරි 15 දිනට ප්‍රථම අදාළ අමාත්‍යංශයේ ලේකම් හා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. මෙම වාර්තාව සමඟ	රජයේ නිලධාරීන් ඇප තැබීම අදාළ ආකෘතිය ප්‍රකාරව වාර්තාවක් සකස් කර විගණනය වෙත 2025.05.30 දිනට පෙර ඉදිරිපත් කිරීමට සටහන් කර ගත් බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.

තවදුරටත් ඇප තැබීමට අවශ්‍ය නොවන නිලධාරීන්ගේ නම්ද, ඇතුළත් විස්තරාත්මක වාර්තාවක් යැවීමට කටයුතු කළ යුතු වුවත් එලෙස ක්‍රියා කර නොතිබුණි.

4.6 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ආයුර්වේද දෙපාර්තමේන්තුව සතුව හෙක්ටයාර 190ක්වූ පර්යේෂණ හා ව්‍යාප්ති සේවා ඔසු උයන් 07ක් පැවතියද, සමාලෝචිත වර්ෂයේදී ඔසු උයන් 03කින් කිසිදු ඖෂධීය අමුද්‍රව්‍යයක් සපයා නොතිබූ අතර ඔසු උයන් 04කින් ඖෂධීය අමුද්‍රව්‍ය කිලෝග්‍රෑම් 906.4ක් පමණක් සපයා තිබුණි.	ආයුර්වේද දෙපාර්තමේන්තුව සතු පර්යේෂණ හා ව්‍යාප්ති සේවා ඔසුඋයන් පිහිටුවීමේ පරමාර්ථය වී ඇත්තේ පරීක්ෂණ හා ව්‍යාප්ති සේවා සඳහා වශ්‍ය පහසුකම් සැපයීම බව, ඊට අමතරව ඔසු උයන්වලින් ලැබෙන ඖෂධ අස්වැනන රෝහල් සඳහා ඖෂධ නිෂ්පාදනයට ලබාදීම සිදුකර ඇති බව.	ඔසු උයන්වලින් ලැබෙන ඵලදාව ආයුර්වේද රෝහල්වල ඖෂධ නිෂ්පාදනයට යොදා ගැනීමට හා ඒ පිළිබඳ ප්‍රමාණවත් වාර්තා පවත්වා ගැනීමට විධිමත් යාන්ත්‍රණයක් ස්ථාපිත කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ ආයුර්වේද ශික්ෂණ රෝහල් 04ක් හා පර්යේෂණ රෝහල් 07කින් ඖෂධ නිෂ්පාදන ලීටර් 252,892ක් හා ඖෂධ කිලෝග්‍රෑම් 11,846ක ඖෂධ පමණක් නිෂ්පාදනය කර තිබුණි. ඒ අනුව ඖෂධ නිෂ්පාදනය හා ඔසු උයන් මගින් ඖෂධ සැපයීම අවම මට්ටමක පවතී.	සමාලෝචිත වර්ෂයේදී ද ඔසු උයන් මගින් රෝහල් සඳහා ඖෂධ නිෂ්පාදනයට මහා පරිමාණයෙන් ඖෂධ සැපයීම සිදු කිරීමට නොහැකි වී ඇත්තේ මෙම ඔසු උයන් මගින් ඖෂධ නිෂ්පාදනය සඳහා මහා පරිමාණයෙන්ම ඖෂධ වගා කිරීම සිදු නොකරන හෙයින් බව, මේ වන විට පවතින ඉඩ ප්‍රමාණයන් කළමනාකරණය කර ගනිමින් රෝහල් සඳහා ඖෂධ නිෂ්පාදනයට අවශ්‍ය ඖෂධ යම් ප්‍රමාණයක් ලබාදීමට කටයුතු සිදු කර ඇති බව.	-එම-

(ඇ)	බොරැල්ල ආයුර්වේද ජාතික රෝහලේ 05 වන මහලේ කොළඹ විශ්ව විද්‍යාලය යටතේ පාලනය වන දේශීය වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනය 2017 ජුනි 02 සිට ස්ථාපිත කර තිබුණද සමාලෝචිත වර්ෂයේදී ද ඒ සඳහා විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණු අතර මාසික කුලියක්ද අයකර ගෙන නොතිබුණි.	පෙන්වා දී ඇති කරුණු සමඟ එකඟ වන බව, 2025.09.30 දිනට පෙර අදාළ ගිවිසුම් ගතවීම සිදු කර විගණනයට වාර්තා කිරිමට සටහන් කර ගත් බව.	ගිවිසුම් ගතවීමට කටයුතු කළ යුතුය.
(ඈ)	මූලාා ප්‍රකාශනවල මූලාා නොවන වත්කම් යටතේ දක්වා තිබුණු වටිනාකම වූ රු. මිලියන 613.83 ක්වූ ඉඩම් 07 ක හා දෙපාර්තමේන්තුව විසින් උපයෝජනය කරන හෙකටයාර 52.7958 ක්වූ ඉඩම් 08ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	ඉඩම් පවරා ගැනීම හා ගිණුම්ගත කිරීම සම්බන්ධ ප්‍රගතිය ඇතුළත් වාර්තාව ඉදිරිපත් කර ඇති අතර මෙම කටයුතු ක්ෂනිකව ඉටු කර ගත නොහැකි බව, අදියරෙන් අදියර පියවරෙන් පියවර ඉදිරියට සිදු කරන බව.	ඉඩම්වල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය.
(ඉ)	මුලාා ප්‍රකාශනවල මුලාා නොවන වත්කම් යටතේ දක්වා තිබුණු වටිනාකම රු.මිලියන 431.58 ක්වූ ගොඩනැගිලි පිහිටි ඉඩම් 09ක අයිතිය දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	- එම -	- එම -
(ඊ)	අනුරාධපුර ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන ව්‍යාපෘතියේ භාවිතය සඳහා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ලබාදී තිබුණු ධාවනයෙන් ඉවත් කර ඇති යතුරු පැදි 20ක් අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ නැවත අමාත්‍යාංශය වෙත භාරදීමට හෝ කටයුතු කර නොතිබුණි.	මෙම යතුරු පැදි දෙපාර්තමේන්තු වත්කම් නොවන බව, අදාළ වත්කම් දේශීය වෛදය අමාත්‍යාංශය සතු වන අතර එම වත්කම් බැහැර කිරීමට අදාළ කටයුතු මේ වන විට සිදු කෙරෙමින් පවතින බව.	අමාත්‍යාංශය වෙත භාරදීමට කටයුතු කළ යුතුය.

5. **තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනතේ 3.6, 3.9,11 හා 11.2 වගන්ති ප්‍රකාරව, ආයතනයේ අරමුණු ළඟාකර ගැනීම උදෙසා සිය සම්පත් කාර්යක්ෂමව මෙහෙයවිය යුතු අතර තිරසර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම පිණිස ආයතනය විසින් සපුරාගත යුතු ඉලක්කයන් හා එම ඉලක්කයන් සපුරා ගැනීම සඳහා පවතින පරතරයන්ද, ප්‍රගතිය මැන බැලීම සඳහා සුදුසු දර්ශකයන්ද හඳුනාගත යුතුය. නමුත් දෙපාර්තමේන්තුව විසින් එවැනි දර්ශකයන් හඳුනාගෙන අරමුණුවලින් ලඟාකරගත් ප්‍රමාණය හා බැහැරවීම් මෙන්ම අවධානය යොමු කළ යුතු විවිධ ක්ෂේත්‍රයන් හඳුනාගෙන නොතිබුණි.	තිරසර සංවර්ධන අරමුණු තුනක් මේ වන විට හඳුනාගෙන ඇති අතර ප්‍රගතියක් මැන බැලීම සඳහා අවශ්‍ය තොරතුරු ආයතන මට්ටමින් රැස් කරමින් පවතින බව.	තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීමට අදාළව ඉලක්ක, දර්ශක හඳුනා ගැනීමට හා ප්‍රගතිය මිණුම් කිරීමට කටයුතු කළ යුතුය.

6. **යහපාලනය**

6.1 **මහජනයා වෙත සේවා ඉටු කිරිම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ මංචන්තෝඩුවායි, මැදවච්චිය, අම්පාර, හම්බන්තොට හා නාවින්න යන ආයුර්වේද පර්යේෂණ රෝහල් 05හි ප්‍රතිකාර ලබා තිබුණු දෛනික නේවාසික රෝගීන් සංඛ්‍යාව අවම මට්ටමක පැවැති අතර එම රෝහල් 05ට අදාළව වාට්ටු 12ක රෝගී ඇඳන් 246ක් පමණ ඌන උපයෝජිතව තිබුණි.	පෙන්වා දී ඇති කරුණු සමඟ එකඟ වන බව, මෙම රෝහල නාවින්න බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පරියේෂණ ආයතනය සමඟ ඒකාබද්ධ කර පර්යේෂණ කාර්යයන් සඳහා යොදවා ගැනීමේ කටයුතු මේ වන විට ආරම්භ කර ඇති බව, ප්‍රගතිය පියවරෙන් පියවර ඉදිරිපත් කිරීමට සටහන් කර ගත් බව.	මහජනයා වෙත සේවා ඉටු කිරීමට අවශ්‍ය කටයුතු සැලැසුම් කළ යුතුය.

(ආ)	සමාලෝචිත වර්ෂයේදී ද බොරැල්ල ආයුර්වේද ජාතික රෝහලේ නව අටමහල් ගොඩනැගිල්ලේ සාමාන්‍ය වාට්ටු ඇඳන් 288ක ධාරිතාවයෙන් 120ක් හෙවත් සියයට 42ක්ද, රෝහලේ පැරණි සාමාන්‍ය වාට්ටුවල ඇඳන් 274කින් 76ක් හෙවත් සියයට 28ක්ද ඌන උපයෝජිතව පැවැති බවද නවගොඩනැගිල්ලේ නවීන කාමර පහසුකම් වලින් සමන්විත ඇඳන් 88ක ධාරිතාවයෙන් යුක්ත ගෙවන වාට්ටු සියල්ලම සහ පැරණි ගෙවන වාට්ටු 32කින් 08ක් ඌන උපයෝජිතව පැවතිම හේතුවෙන් රෝගී සත්කාර සේවා නිසි පරිදි ඉටු කර නොතිබුණි.	පෙන්වා දී ඇති කරුණු සමඟ එකඟ වන බව, 2025 වර්ෂය අවසන් වන විට අත්‍යවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කර අවසන් කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර ඇති බව, ඒ අනුව සකස් කර ඇති සැලසුම් අනුව ඉදිරි කටයුතු සිදු කර විගණනයට වාර්තා කිරීමට සටහන් කරගත් බව.	-එම-
(ඇ)	පාරම්පරික වෛද්‍ය ක්‍රම, බෝ නොවන රෝග නිවාරණ, යුනානි ආයුර්වේද, වකුගඩු රෝග, ආයුර්වේද සාහිත්‍ය, ආයුර්වේද මූලධර්ම, ආයුර්වේද චිකිස්සාව හා ආයුර්වේද ඖෂධ පිළිබඳ පර්යේෂණයන් සිදු කිරීම සඳහා ආයුර්වේද පර්යේෂණ රෝහල් 07 ක් ස්ථාපිත කර තිබුණද, නාවින්න ආයුර්වේද පර්යේෂණායතනයේ හැර සියළුම පර්යේෂණ රෝහල්වල ආයුර්වේද පර්යේෂණ වාර්තා, ප්‍රකාශන හෝ නව ඖෂධ හඳුන්වා දීමක් සිදු කර නොතිබුණි.	පෙන්වා දී ඇති කරුණු සමඟ එකඟ වන බව, මෙම ආයතන 06 සඳහා වසර ගණනක සිට විධිමත් පරිදි ප්‍රධානින් පත්කර ගැනීමට නොහැකි වීම මත මෙම තත්වය උදා වී ඇති බව, කෙසේ වුවද අදාළ පාර්ශවයන් දැනුවත් කර ඉදිරිකටයුතු සිදු කිරීමට සටහන් කරගත් බව.	-එම-

7. **මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දෙපාර්තමේන්තුව සඳහා කළමනාකරණ දත්ත පද්ධතියක් සකස් කර ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද සමාලෝචිත වර්ෂයේද අදාළ දත්ත පද්ධතිය ස්ථාපිත කර නොතිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව හා එහි අනුබද්ධ ආයතන, රෝහල්, වෛද්‍ය මධ්‍යස්ථාන ඇතුළු සම්පූර්ණ ආයතන පද්ධතියට අදාළ යාවත්කාලීන කළමනාකරණ තොරතුරු කාර්යක්ෂමව ලබා ගැනීමට අපහසුව පැවැති අතර දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩල පැමිණීම හා පිටවීම සටහන් කිරීමේ පාලනය, කාර්යසාධන පාලනය, වැටුප් පාලනය, අතිකාල වියදම් පාලනය, පුද්ගලික ලිපිගොනු පාලනය යනාදී පාලනයන් දුර්වල මට්ටමක තිබුණි.	පෙන්වා දී ඇති කරුණු සමඟ එකඟ වන බව, 2022 වර්ෂයේදී මෙම කාර්යය සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබුනද රට තුළ පැවති දැඩි මූල්‍ය අර්බුදය මත අදාළ ප්‍රතිපාදන අවුරා තබන ලද බව, කෙසේ වුවද දෙපාර්තමේන්තුවේ දැනට ඇති සම්පත් උපයෝජනයෙන් මෙහි මූලික අදියරේ කටයුතු 2025 වසර තුළදී ඉටු කර ගැනීමට සැලසුම් කර ඇති බව, අදාළ ප්‍රගතිය 2025.12.31 දිනට පෙර වාර්තා කිරීමට සටහන් කර ගත් බව.	දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රය, රෝහල්, ඔසු උයන්, ප්‍රජා සෞඛ්‍ය ප්‍රාදේශීය කාර්යාල, යනාදී සියළුම අංශවල කටයුතු සම්බන්ධීකරණය කළ හැකි කළමනාකරණ දත්ත පද්ධතියක් ස්ථාපිත කළ යුතුය.
(ආ)	2024 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 2,393ක් වුවද, එදිනට තථ්‍ය කාර්ය මණ්ඩලය 1,614ක් වුයෙන් අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 30කට සමාන පුරප්පාඩු 725ක් විය. තවද මෙම පුරප්පාඩු තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 132ක්ද තෘතියික මට්ටමේ පුරප්පාඩු 35ක්, ද්විතියික මට්ටමේ	පෙන්වා දී ඇති කරුණු සමඟ එකඟ වන බව, මේ පිළිබඳව දිගින් දිගටම අදාළ අංශවෙත ලිඛිතව වාර්තා කළද රජයේ බඳවා ගැනීම් ප්‍රතිපත්තිය තුළ දන්වා ඇති පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට නොහැකිව දෙපාර්තමේන්තුව දැඩි අර්බුදකාරී තත්වයක පවතින බව.	ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු සහ රෝහල්වල අත්‍යවශ්‍ය තනතුරුවලට ප්‍රමුඛතාව දෙමින් පවතින මානව සම්පත්වලින් උපරිම ඵලදායිතාවයක් ලබා ගැනීම සඳහා කාර්යමණ්ඩල ප්‍රතිසංවිධානයක් සිදු කළ යුතුය.

	පුරප්පාඩු 322ක් හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 236ක් පැවතීම හේතුවෙන් දෙපාර්තමේන්තුවේ හා ආයුර්වේද රෝහල්වල කාර්ය සාධනයට දැඩි බලපෑමක් සිදු වී තිබුණි.		
(ඈ)	ආයුර්වේද පර්යේෂණ රෝහල් 06 ක් සඳහා පර්යේෂණ කාර්යය මණ්ඩලයක් අනුමත කරගෙන නොතිබුණු අතර බණ්ඩාරනායක අනුස්මරණ පර්යේෂණ ආයතනය සඳහා එක් එක් විෂය ක්ෂේත්‍රයට අදාළව පර්යේෂණ නිලධාරි තනතුරු 18 ක් හා පර්යේෂණ සහායක තනතුරු 12 ක් අනුමත කරගෙන තිබුණද, ඉන් කිසිවෙකු බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.	- එම -	ආයුර්වේද පර්යේෂණ රෝහල් පිහිටුවීමෙන් අපේක්ෂිත කාර්යසාධනය ළඟා කර ගැනීම සඳහා එක් එක් විෂය ක්ෂේත්‍රයට අදාළව පර්යේෂණ නිලධාරි සහ පර්යේෂණ සහායක තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කළ යුතුය.